# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION


සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1509/ 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 03/12/2023<br>පැය 1855 |

## මාධ්‍ය නිවේදනය

### 01. මනුෂ්‍ය ඝාතනයක් - කල්මුණ පොලිස් ස්ථානය.

2023.11.30 වන දින උදෑසන කාලයේදී කල්මුණ පොලිස් වසමේ ඉස්ලාම්බාද් පිහිටි ළමා ආරක්ෂන නිවස්නයක රඳවා සිටි ළමයෙකු සිහිසුන්ව වැටී සිටින බවට එහි භාරකරු කල්මුණ පොලිස් ස්ථානයට සිදුකර ලද පැමිණිල්ලක් මත විමර්ශන ආරම්භ කර ඇත.

පොලිසිය විසින් සිදු කල විමර්ශනයේදී මෙම ළමයා මිය ගොස් සිට ඇති අතර ඒ සම්බන්ධව කල්මුණ ගරු මහේස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කිරීමෙන් පසු අධිකරණ නියෝග මත 2023.12.02 වන දින අම්පාර රෝහලේදී පශ්චාත් මරණ පරීක්ෂණ කටයුතු සිදු කර ඇත.

**මිය ගිය ළමයා වයස අවුරුදු 17 ක් වූ මඩකලපුව, කොකුවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මිය ගිය ළමයා අධිකරණ නියෝග මත 2023.11.17 වන දින සිට ළමා ආරක්ෂණ නිවස්නයේ රඳවා සිට ඇත. මෙම මරණය සම්බන්ධයෙන් සිදු කල පශ්චාත් මරණ පරීක්ෂණයේදී මෙය පහර දීමක් මත සිදු වූ මරණයක් ලෙස අධිකරණ වෛද්‍යවරයා විසින් වාර්තා කර ඇති අතර ඒ අනුව සිදු කල වැඩිදුර විමර්ශනයේදී එම ළමා ආරක්ෂණ නිවස්නයේ පාලිකාවක් විසින් මිය ගිය ළමයාට පහරදීමක් සිදු කර ඇති බවට අනාවරණය වී ඇති අතර සැකකාරිය කල්මුණ පොලිස් ස්ථානයට භාර වීමෙන් පසු අත්අඩංගුවට ගෙන ඇත.

අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 28 ක් වූ ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පදිංචිකාරියකි. ඇය අද දින කල්මුණ ගරු මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් පසු 2023.12.04 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාර ගතකර ඇත. කල්මුණ පොලිසිය වැඩිදුර විමර්ශන කටයුතු සිදු කරනු ලබයි.

**02. මනුෂ්‍ය ඝාතනයකට අවශ්‍ය කර සිටි සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගැනීම - පැලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2023.11.28 වන දින රාත්‍රී කාලයේ වත්තල පොලිස් වසමේ ඇල පාර, පල්ලිය වත්ත ප්‍රදේශයේ දී වත්තල ප්‍රදේශයේ හෝටලයක සේවය කල වයස අවුරුදු 68 ක් වූ වෙහෙරහේන, මාතර ප්‍රදේශයේ පදිංචි පුද්ගලයකු තියුණු ආයුධ වලින් පහරදී ඝාතනය කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා වත්තල පොලිසිය හා පැලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මඟින් විමර්ශන ආරම්භ කර තිබුණි.

ඒ අනුව සිදු කල විමර්ශනයේදී අපරාධ ස්ථානය අවට සවි කර තිබූ සී.සී.ටී.වී කැමරා දර්ශන පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ තොරතුරු මත සැකකරුවන් පැමිණි ත්‍රීරෝද රථය හඳුනා ගැනීමෙන් පසු මනුෂ්‍ය ඝාතනය සම්බන්ධයෙන් සැකකරුවන් දෙදෙනෙකු හා ඊට ආධාර අනුබල දීම සම්බන්ධයෙන් ත්‍රීරෝද රථයේ රියදුරු ත්‍රීරෝද රථයද සමඟ 2023.12.02 වන දින සවස් කාලයේ දෙමටගොඩ හා කටුනායක ප්‍රදේශවලදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 36 හා 44 වයස් වල පසුවන කොළඹ 09 ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෙම අපරාධය 2023.11.25 වන දින මට්ටක්කුලිය, රජමල්වත්ත ප්‍රදේශයේදී ඇති වූ ආරවුලක් මත පුද්ගලයෙකු තියුණු ආයුධ වලින් පහර දී තුවාල සිදු කිරීමකට පලි ගැනීමක් වශයෙන් දැනට ඩුබායි රාජ්‍යයට පලා ගොස් සිටින පුද්ගයෙකුගේ මෙහෙයවීම මත සිදු කර ඇති බවට විමර්ශනයේදී අනාවරණය වී ඇත. තවද කටුනායක ප්‍රදේශයේදී අත්අඩංගුවට ගත් සැකකරු අපරාධයෙන් පසු මාලදිවයිනට පලා යාම සඳහා කටුනායක ගුවන්තොටුපල වෙත පැමිණ සිටියදී මෙසේ අත්අඩංගුවට ගෙන ඇති අතර ඔහු සන්තකයේ තිබී අපරාධය සිදු කිරීමට යොදා ගත් බවට සැකකරන ජංගම දුරකථන දෙකක් සමඟ විදේශ ගමන් බලපත්‍රයද නිලධාරීන් භාරයට ගෙන ඇත.

වත්තල පොලිසිය හා පැලියගොඩ කොට්ඨාස අපරාධ විමර්ශන අංශය මඟින් වැඩිදුර විමර්ශන සිදු කර ගෙන යනු ලබයි.

**03. මත්පැන් සහ ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මතුගම පොලිස් ස්ථානය.**

2023.12.02 වන දින සවස් කාලයේ මතුගම පොලිස් ස්ථානයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැලිපැන්න පොලිස් වසමේ 05 කණුව ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **නීති විරෝධී මත්පැන් ලීටර් 12 ක් සහ ගෝඩා ලීටර් 2128 ක්** සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු අවුරුදු 45 ක් වන මීගහවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මතුගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**